# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



# ගැලීලියෝගේ කැරකෙන ලෝකය

**1609 විය ඒ වසර.**
**විද්‍යාවේ ආලෝකය දීප්තියෙන් බැබළුණු,**
**පාදුවා නගරයෙහි සාමාන්‍ය නිවෙසක විසූ**
**ගැලීලියෝ ගැලීලි නම් ඔහු,**
**වෙහෙසුණි සනාථ කරන්නට**
**එක තැනක තිබියදීත් හිරු,**
**ගමන් කරන බව පෘථිවිය ඒ වටා**
**- ගැලීලියෝ ගැලීලි නාටකය**


ඉතාලි ජාතික, තාරකා විද්‍යාඥ ගැලීලියෝ ගැලීලි (1564 - 1642) නාමය, ලෝකප්‍රකටය.

ජර්මන් ජාතික බර්ටෝල් බ්‍රෙෂ්ට් මෙන්ම ඔහු කළ නාට්‍යයන්ද ලෝකප්‍රකටය. ඉන් එකක් වූයේ 'ගැලීලියෝ ගැලීලි' නමින්ම යුත්, එම විද්‍යාඥයාගේ ජීවිතය පසුබිම් කරගත් නාටකයයි.

ගැලීලියෝ එකල පැවති අධිපති මතවාදයන්ට එරෙහිව තම නව සොයාගැනීම් සමාජගත කළේය. බ්‍රෙෂ්ට් ද දූෂිත සමාජ ක්‍රමයට එරෙහිව, ජනතාව අවදි කරවනු පිණිස නාට්‍යය නිර්මාණය කළේය. 1983දී, පරාක්‍රම නිරිඇල්ල හා එච්. ඒ. පෙරේරා එකතුව බ්‍රෙෂ්ට්ගේ ගැලීලියෝ (life of galileo) මෙරට වේදිකාවට ගෙන ආහ. එය සිංහලට පරිවර්තනය කළේ, එවකට පාර්ලිමේන්තුවේ හැන්සාඩ් අංශයේ සේවයෙහි යෙදුණු භාෂා පරිවර්තක නීල් ශ්‍රී විජේසිංහයන් විසිනි. පදානුගත පරිවර්තනය එය වේදිකාවට සුදුසු සේ සැකසීම, නිරිඇල්ලයන් අතින් සිදු විය.



පරාක්‍රම නිරිඇල්ල



එච්. ඒ. පෙරේරා



ලක්ෂ්මන් ඉලංගකෝන්

'ගැලීලියෝ' හි නළු නිළියන් ඇතුළු නාට්‍ය කණ්ඩායම 70 ක් පමණ විය. වේදිකා පසුතල ලොරියක පටවා ගෙන යා යුතු තරම් විශාල විය. එබඳු නිෂ්පාදන ලංකාව තුළ පවත්වාගෙන යෑම, එදා නොව අද පවා ප්‍රායෝගික නොවන බව කිව යුතු නොවේ. නිරිඇල්ල හා එච්. ඒ. ගේ ගැලිලියෝ ද, දර්ශන වාර දහයකට සීමා වූයේ එහෙයිනි.

ඒ දර්ශනවාර දහයෙන් එකක්, ලුම්බිණියේ දී හෝ නව රඟහලේ දී නැරඹීමේ වාසනාව ලද මා, අදත් එය දකින්නේ මෙරට නිෂ්පාදනය වූ විශිෂ්ටතම නාට්‍යයක් ලෙසිනි. පසු කලෙක නිරිඇල්ල විසින්ම නිෂ්පාදනය කරන ලද, ස්විස් ජාතික නාට්‍යකරු 'ෆෙඩ්රික් ඩියුරන්මාට්' ගේ 'උත්තමාවි' නාට්‍ය ද විශිෂ්ට නිර්මාණයක් වුව ද රංගගත වූයේ දර්ශනවාර කිහිපයකි.


ජාතික රූපවාහිනියේ සිටියදී, විදේශ පුහුණුවක් සඳහා ජර්මනියට යන නිරිඇල්ලට, එහි 'බර්ලීන් එන්සෙම්බල්' රංග ශාලාවේදී, 'ගැලීලියෝ' නිෂ්පාදනයක් දක්නට ලැබෙයි. එය අති විශාල වේදිකා පසුතල වලින් තොර, එහෙත් නාටකීය ගුණයෙන් පිරුණු, ප්‍රබල රංගනයක් විය. බ්‍රෙෂ්ට් රංගනයේ දී ඊට දරාගත නොහැකි "බර වැඩ" අත්‍යාවශ්‍ය නොවන බව නිරිඇල්ල ට අවබෝධ වෙයි.

ගැලීලියෝ සහ නිරිඇල්ල පිළිබඳ පැරණි මතක සටහනකට නිමිත්ත වූයේ, මෑතක දී ප්‍රකාශයට පත් 'ගැලීලියෝ' නාට්‍යයේ නව පරිවර්ථනයකි. එය සිංහලට පෙරළා ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කළ, විශ්‍රාමික නාවික හමුදා අද්මිරාල් වරයකු වන ලක්ෂ්මන් ඉලංගකෝන් විසිනි. මුහුද ගැන දන්නා නාවිකයකුට ගැලීලියෝ 'හමුවීම' ද අරුමයක් නොවේ. ගැලීලියෝ නාටකයේ තැනෙක මෙසේ ද දැක්වෙයි.

බර්බෙරිනි: (ගැලීලියෝ වෙතට ඇඟිල්ලක් දිගු කරමින්)

සූර්යයා ඉහළ නගී. සූර්යයා බැස යයි. නැවත වරක් ඒ නැගුණු තැනටම ආපසු පැමිණෙයි. එවක්ලෙසියාවේ දේශකයා එසේ පැවසීය. ගැලීලියෝ පවසන්නේ කෙලෙසද?

ගැලීලියෝ: මම වරක් නැවක සිටින විට කෑ ගැසුවා, වෙරළ මගෙන් ඈත් වෙන බව පවසා. නමුත් මම අද දන්නවා, වෙරළ නොවේ ඈත් වුණේ, අපි වෙරළෙන් ඈත් වුණේ කියා.





දර්ශන ප්‍රකාශකයන් විසින් දර්ශනීය නිමාවකින් යුතුව, ප්‍රකාශයට පත්කර ඇති 'ගැලීලියෝ ගැලීලි' හි අගය වැඩි කරවන විශේෂත්වයක් වන්නේ, ඇතැම් ඉංග්‍රීසි පරිවර්තනයන්හි, මගහැරී හෝ අතහැරී ඇති කොටස් ද එක් කිරීමට, පරිවර්තක ඉලංගකෝන් විසින් කටයුතු කර තිබීමය. එහි පූර්විකාවෙහි මෙසේද සඳහන්ය. 'ගැලීලියෝ ගැලීලි 1564 වසරේ ඉපිද, 1642 ජනවාරි 8 දා මිය යයි. ගැලීලියෝ තාරකා විද්‍යාඥයකු, භෞතික විද්‍යාඥයකු, සහ දක්ෂ ඉංජිනේරුවකු වූ අතර, ඔහු නවීන භෞතික විද්‍යාවේ, නිරීක්ෂණ තාරකා විද්‍යාවේ පියා ලෙස සලකනු ලැබේ.'

මෙම නාට්‍යය ලියැවෙනුයේ, ගැලීලියෝගේ ජීවිතයේ සත්‍ය සිද්ධීන් කිහිපයක් මුල්කරගනිමින් වුවද, ඇතැම් දෑ නාට්‍යයට උචිත ලෙස සකසා


## උඩුපෙළ සහ යටිපෙළ

ඇත. නිදසුනක් ලෙස ගැලීලියෝගේ දියණිය 'වර්ජිනියා', නාට්‍ය තුළ සිය පියාගේ සෙවනේ වෙසෙන බවක් දැක්වුණ ද, සැබෑව වන්නේ ඇයට වයස 13 ක් වන විටම කන්‍යා සොයුරියක බවට පත්වීමය. එසේම වයස 34 දී වර්ජිනියා මියයයි.

2011 දී, සමන් පුෂ්ප ලියනගේ විසින්ද 'ගැලීලියෝ' සිංහල පරිවර්තනයක් (සංහිඳ ප්‍රකාශන) කළේය. එහි හැඳින්වීමෙහි ලියනගේ මෙසේ ලියයි.

'ගැලීලියෝ යනු ප්‍රේක්ෂකයා තුළ ඥානය ජනනය කරවන, විචාර බුද්ධිය වර්ධනය කරවන නාට්‍යයකි. එය විද්‍යා පුනරුදය ගැන දැනුම ලබාදෙන අතරම, දේශපාලන ඥානයක් ද උත්පාදනය කරයි.

බ්‍රෙෂ්ට්, ගැලීලියෝව ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන්නේ උතුම් ගුරුවරයකු ලෙසයි. නාට්‍යයේ මූලික අවධානය යොමු වන්නේ ගැලීලියෝ කළ





පාපොච්චාරණය වෙත නොවේ.'

බ්‍රෙෂ්ට් මෙම නාට්‍ය රචනා කරන්නේ 1938 දීය. ඓතිහාසික තේමාවක් තුළ කාලීන ප්‍රශ්න ගැන කතා කිරීමට ඔහු සමත් වෙයි. පරම ඒකාධිකාරී අත්තනෝමතික රජයකින් ආරක්ෂා වන අන්දම ද ඔහු මෙම නාට්‍යයෙන් ජර්මන් බුද්ධිමතුන්ට කරුණු කියාපෑවේය.

ඉතාලි කතෝලික සභාව ගැලීලියෝගේ විද්‍යාත්මක සත්‍යයන් හා එකඟ නොවුණේය. එහෙයින් ඔහුට තම පර්යේෂණ වාර්තා, රහස් මාර්ගයන්ගෙන් රටින් පිට කිරීමට සිදු වූවාක් මෙන්ම, ජීවිතයේ අවසන් සමයේ නිවාස හිර අඩස්සියේ ගත කිරීමට ද සිදු විණි.

කොපර්නිකස් විසින් හඳුන්වා දුන්, 'සූර්ය කේන්ද්‍රවාදය' තවදුරටත් සනාථ කළ ගැලීලියෝ, ආර්ථික ප්‍රශ්නවලින් පෙළුණෙකි. ඔහුට සරසවි අධ්‍යාපනය මඟදී අතහැර දැමීමට සිදු වන්නේද, නිසි පරිදි ගාස්තු ගෙවීමට නොහැකි වන බැවිනි. ඔහු තම පවුලේ වගකීම් ඉටුකිරීම සඳහා, සිසුනට ගණිතය විෂය උගන්වමින්, සුළු ආදායමක් ලබයි. පසු කලෙක ඔහු පීසා විශ්වවිද්‍යාලයෙහි ගණිතය පිළිබඳ ආචාර්ය වරයකු බවට ද පත්වෙයි.

දුරේක්ෂයන්ගෙන් ආකාශ වස්තු පරීක්ෂා කරමින් නිදි වර්ජිතව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ගැලීලියෝ අන්ධ භාවයට ද පත් වෙයි. තමා සොයාගත් සත්‍ය වෙනුවෙන් බොහෝ දුක් විඳි - නින්දා අපහාස ලැබූ මේ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයාට, කතෝලික පල්ලියෙන් සමාව ලැබෙන්නේ 1992 තරම් මෑත කාලයකදීය.

'ගැලීලියෝ' නාට්‍යයේ එක් අවස්ථාවක, ෆිලිෆෝ මුසියස් නමැති විද්වතකු හා ගැලීලියෝ අතර, මෙබඳු සංවාදයක් ඇතිවෙයි.

ගැලීලියෝ: දුෂ්කරතාවන් ගැන කතා කරන්නට එපා. මම වසංගතයට වත් ඉඩ දුන්නේ නෑ, මගේ පරීක්ෂණ නවත්තන්න. මුසියස්: ගැලීලියෝ මහත්මයා, වසංගතය නොවේ නරකම එක. ගැලීලියෝ: මෙන්න මේක අහගන්න. සත්‍ය නොදන්නා පුද්ගලයා මෝඩයෙක් පමණයි. නමුත් සත්‍ය දැන එය අසත්‍ය යැයි කියන්නා අපරාධකාරයෙක්. මගේ නිවෙසෙන් වහාම පිටවෙන්න.

(පිටුව 144 - ඉලංගකෝන් පරිවර්තනය)

ගැලීලියෝගේ මෘත දේහයෙහි, ඔහුගේ දකුණතෙහි ඇඟිලි තුනක් නොවූ බවද ප්‍රකට කතාවකි. කිසිවකු විසින් එම ඇඟිලි කපා ගෙන තිබුණි. හේතුව, ගැලීලියෝ විසින් තම සත්‍ය ගවේෂණ සඳහා දුරේක්ෂය භාවිතා කිරීමට ප්‍රධාන වශයෙන් යොදා ගත්තේ එම ඇඟිලි තුන වීමය.

'ගැලීලියෝ' නාට්‍ය සිංහල වේදිකාවට හඳුන්වා දීමෙන් පරාක්‍රම නිරිඇල්ල හා එච්.ඒ. පෙරේරා විසින් ද, එය සිංහලට පරිවර්තනය කිරීමෙන් මෙයින් ශ්‍රී විජේසිංහ (1983), සමන් පුෂ්ප ලියනගේ (2011) සහ ලක්ෂ්මන් ඉලංගකෝන් (2020) විසින්ද ඉටුකර ඇත්තේ ප්‍රශංසනීය කාර්යභාරයකි. මෙම කෙටි සටහන ඔවුනට කෙරෙන උපහාරයකි. 'ගැලීලියෝ' යනු ගැඹුරු දෘශ්‍ය කාව්‍යයකි. එය, මෙරට තරුණ නාට්‍යකරුවන් ඉදිරියේ ඇති, සොඳුරු අභියෝගයකි.

ගැලීලියෝ ද පෙන්වා දුන් පරිදි, සත්‍යයේ ජයග්‍රහණය පවතිනුයේ, ඒ සඳහා කැප වන මිනිසුන් දැතෙහි ය.




**කපිල කුමාර කාලිංග**

---

## චීදුවස

සොඳුරුමය



ආචාර්ය සරච්චන්ද්‍රගේ මනමේ නාටකයේ මනමේ බිසව අත වූ කඩුව උදුරා ගෙන වැදි රජු විසින් මනමේ කුමරු මරණයට පත් කිරීමෙන් අනතුරුව පොතේ ඉන්නිසයෙන් කියැවුණේ මෙවැන්නකි.

මනමේ රජ සිය බිසව පැවසූ වදන — අසා
වුණු මේ වෙනස කිම සිත චංචල විය — විගසා
දැක ඒ ප්‍රමාදය වැදි රජු මිදුණෙය — නොලසා
අනේ එවිපත සිදු වුණි නොදනිම් කාගෙ — දොසා


## අනේ මෙ විපත් සිදු වුණි නොදනිම් කාගෙ දොසා

1956 නොවැම්බර් 3 දා පළමු වරට කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහලේ දී මනමේ වේදිකාගත වූ දා සිට වසර හැට හතරකට ආසන්න කාලයක් තිස්සේ මනමේ නැරඹූ, නරඹන ප්‍රෙක්ෂකයන් පිළිතුරු සොයන ප්‍රශ්නාවලියකි. මනමේ කුමරිය වැදිරජුගේ හැඩිදැඩි පෙනුමට ලොබ බැඳ ඔහුට කඩුව උදුරා ගන්නට ඉඩ හැරියා ද? වැදිරජු තනිවම සටන් කොට අවසන මනමේ රජුගේ ග්‍රහණයට හසුව සිටි මොහොතේ ඔහුගේ උදාර ගුණය පිළිබඳ කියූ වදනින් කුමරුගේ සිත චංචල වූ බැවින් වැදිරජු ග්‍රහණයෙන් මිදී කඩුව උදුරා ගෙන කුමරු මරණයට පත් කළා ද? නිශ්චිත පිළිතුරක් සොයා ගත නොහී ප්‍රේක්ෂකයන් රඟහලින් එළියට විත් නගන නෙක තර්ක විතර්කයන්හි අඩුවක් නැති බව දනිමු. එවිපත සිදු වූයේ කාගේ වරදින්දැයි නොදන්නා බව පවසන නාට්‍යකරුවා ඊට හේතු සෙවීම ප්‍රේක්ෂකයනට භාර කරයි. මේ ජවනිකාව මාහට සිහිපත් කළේ ඉතාම ආසන්න දිනෙක සිට එනම්, ඔක්තෝබර් දෙවන සතියේ ආරම්භයේ දී මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හල් සේවිකාවකට කොරෝනා ආසාදනය වී ඇති බව වෛද්‍ය පරීක්ෂණවලින් තහවුරු වීමත් සමගය.

මනමේ නාටකයේ නාටකීය ජවනිකාව මෙන් කොරෝනා වසංගතයේ දෙවන රැල්ල කෙලෙස සිදු විණි ද යන්නට පිළිතුරු සෙවීමට ශ්‍රී ලංකාවේ රජයට, සෞඛ්‍ය සහ ආරක්ෂක අංශවලට සිදුවීම සබැවින් ම අතිශය දුඃඛදායක සිදුවීමක් නොවන්නේ ද කියා කල්පනා වන්නේ, මාර්තුවේ සිට කොරෝනාවෙන් බැට කෑ දේශයක්, ජාතියක්, ඊට නිර්භීතව මුහුණ දී කොරෝනා සතුරා සාර්ථකව මැඩ ලූ ලෝකයේ සෙසු රටවල් සමග ජයග්‍රාහීව සිටි මොහොතක යළි හිස එසවීම නිසාය.

මාර්තුවේ සිට සමස්ත ශ්‍රී ලංකාවාසීන් මුහුණ දුන් ඒ වේදනාබර අතීතයට ආයුබෝවන් කීවා පමණි. යළි මේ විපත සිදු වූයේ කෙසේ ද? කාගේ වරදින් ද? ඊට වගකිව යුත්තෝ කවරහු ද? දිනෙන් දින ව්‍යාප්ත වන්නට පටන් ගත් ආසාදිතයන්ගේ සංඛ්‍යාව මිනුවන්ගොඩ, දිවුලපිටිය මතු නොව ගම්පහ දිස්ත්‍රික්කයට පමණක් හෝ සීමා කර ගැනීමට හැකි වේ ද යනාදී අභියෝගාත්මක ප්‍රශ්න රැසක් හමුවේ අප සිටිමු. අනේ මේ විපත සිදු වුණේ කාගේ දොසකින් ද?

දැන් යළිත් අපගේ ජන ජීවිතය අඩාළ වී ඇත. සාමාන්‍ය ජනතාවට යළිත් බියෙන් හා සැකයෙන් ජීවත්වන්නට, ඊට පුරුදුවන්නට සිදු වී ඇත. මාර්තුවේ සිට අගෝස්තුව අවසානය පමන වන තෙක් නිවෙස්වලට, ගම් බිම්වලට සිර වී කොටු වී සිටි ජනතාව, පෙර විදි නිදහස අත් විඳිමින් සුපුරුදු ලෙස ගමින් ගමට නගරයෙන් නගරයට රිසි ලෙස ඇවිදින්නට, නෑදෑ හිත මිතුරන් හමුවන්නට නාට්‍යයක්, චිත්‍රපටයක් නරඹන්නට සැරසුණා පමණි. පවුලේ දූ පුතුන් හා නිවසින් බැහැරට ගොස් එළිමහන් පිටියක දූ දරුවන්ට කෙළි සෙල්ලම් කරන්නට, ඔවුන් හා බොජුන් හලකින් ආහාර වේලක් ගන්නට නිදහස ලැබුණා පමණි. ලොවම



ගිලගෙන සිටින කොරෝනා වසංගතකරුවා යළි වෙස් වළාගෙන විත් සිත් පිත් නැති රකුසකු ලෙසින් අපගේ මව්බිම පෙළනු දක්නට ලැබීම කෙතරම් අවාසනාවන්ත අත්දැකීමක් ද? පළමු ආසාදිතයා ගේ සිට පොකුරක් වී ඇති ආසාදිතයන් සියල්ල හමුවූයේ එකම නගරයකින්, දෙකකින්, දිස්ත්‍රික්කයකින්, කම්හලකින් හෝ කම්හල් කීපයකින් වූවත් කොරෝනා වසවර්තියාට රිසි ලෙස රට පුරා සරන්නට හැකි බව අපි දනිමු. දනටමත් ගම්පහ දිස්ත්‍රික්ක්යෙන් පිට නගර ගම්වලින් ආසාදිතයන් හමු වී ඇති බව වාර්තා වේ. මේ තීරුව ලියන හත්වනදා, බදාදා වන විට වාර්තා වී ඇති ආසාදිතයන් සංඛ්‍යාව 800 ඉක්මවා ඇත. බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ සේවක සේවිකාවන් මෙන්ම මිනුවන්ගොඩ, දිවුලපිටිය ආදී නගර ආශ්‍රිත ඇඟලුම් කම්හල සියල්ලෙහි සේවක සේවිකාවන් පීසීආර් පරීක්ෂණවලට භාජනය කෙරෙන බව ද, වරින් වර දවස පුරා හා රාත්‍රියෙහි පනවන ඇඳිරි නීතිය ද ජන ජීවිතය අඩාල කරන මුත් ව්‍යාප්තිය වළක්වනු වස් එබඳු ක්‍රියාමාර්ග ගනීම අනිවාර්ය වේ. අහඹු ලෙස හමු වූ ඇඟළුම් සේවිකාව නොවන්නට කොරෝනා දෙවන රැල්ල කොතනින් නතර වන්නට තිබුණා ද කියා සිතා ගැන්මටත් අපහසුය. දිවයිනෙහි පාසල් සියල්ල වැසී ඇත. උත්සව සාද,

සම්භාෂණ, ජන හමු, රැස්වීම්, නිවසින් බැහැර ගමන් බිමන්, විනෝද චාරිකා සියල්ල නැවතී ඇත. පෙර විඳි අත්දැකීම කියා දුන් පාඩම් නිසා බියට පත්ව සිටින් සෙසු පෙදෙස්වල ජනතාව සුපර් මාර්කට් පිරිසිදු කිරීමට පටන් ගෙන ඇත. නගරයේ එක් සුපර් මාර්කට්ටුවක ඊයේ ( 6) දහවල් වන විට කුමන වර්ගයේ හෝ හාල් ඇටයක්, පරිප්පු ඇටයක් මිලට ගන්නට නොතිබිණ. පොල් පිළිබඳ ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර වෙමින් පවතී. "මහත්තයෝ යන්තම් ඔළුව ඉස්සුවා විතරයි, බලන්නකෝ මේ පාත් වුණ හෙන ගෙඩිය, මිනිස්සු ගමන් බිමන් යන්න පාරට එන්නෙ නෑ, ඉස්කෝල ළමයි නෑ, ලීස් එක ගෙවන්න දීපු සහන කාලෙත් නෑ." ඒ ත්‍රීරෝද රියැදුරකුගේ මැසිවිල්ලයි. එදිනෙදා ජීවිකාව හොයාගන්නා දහසකුත් දෙනා කොරෝනා වසංගත සතුරා ගේ ග්‍රහණය නිසා බැට කන්නේ ඔවුන් කිනම් වරදක් කළාට ද?මේවා පිළිතුරු හෝ විසඳුම් සොයන්නට හැකි ප්‍රශ්න ද?

අවිනිශ්චිතබව සහ බිය ජන හදවත් වසා පැතිරී යන මේ මොහොතෙහි කොරෝනා දෙවන රැල්ලට හේතු කාරක සොයන නොයෙක් වර්ගයේ පිරිස් දැන් කල එළි බැස සිටිනු පෙනේ. මේ අවාසනාවන්ත අවස්ථාව තුළින් දේශපාලන වාසි සොයන්නෝ එක් පිරිසකි. රෝගකාරක සේවිකාවට චරිත සහතික ලියන්නට ඉදිරිපත් වී සිටින සමාජ මාධ්‍ය ජාලා ක්‍රියාකාරිකයෝ, නොදන්නා කරුණු කාරනා පිළිබඳ මුහුණු පොත හෝ වෙනත් වෙබ් අඩවි ඔස්සේ සත්‍යයෙන් ඈත පුවත් මවමින් තම පාණ්ඩිත්‍යය ප්‍රදර්ශනය කිරීමට කැස කවන ඊනියා මාධ්‍යවේදීන් හා වේදිනියන් එමටය. ඇඟලුම් කම්හල් සේවිකාවගේ චරිතය ඝාතනය සඳහා ඔවුන් විසින් ගොතනු ලබන ප්‍රබන්ධ ඩබ්ල්යු.ඒ.සිල්වා සූරීන්ගේ ප්‍රබන්ධවල හෝ කියවන්නට නොලැබෙන වර්ගයේ අභව්‍ය සිදුවීම්ය. රජයේ සෞඛ්‍ය හෝ ආරක්ෂක අංශවලට මෙතෙක් සොයා ගන්නට නොහැකි වූ තොරතුරු වාර්තා කිරීමට ජන මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය ද පෙරට විත් සිටී. දෙවන රැල්ල මෙලෙස එක් වර මතු වූයේ ජනතාවගේම වරදින් කියා නැගෙන චෝදනාවලත් කිසියම් සත්‍යයක් තිබෙනවා නොවෙද? මීටරයක දුරස්ථභාවය, අත් සෝදා පිරිසිදුවීම, මුව ආවරණ පැළඳීම වැනි මූලික සෞඛ්‍ය ආරක්ෂක අවශ්‍යතා පිළිබඳ උනන්දුව හා අවධානය ලිහිල්වීම රෝග ව්‍යාප්තියට තුඩු නොදුන්නේ ද? පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීමෙන් දැන් කුමන පලක් ද? විපත සිදු වී හමාරය. කාගේ දොසකින් වූවක්ද යන්න නොව, අප විසින් කළ යුත්තේ සිදු වී ඇති විපතෙහි භයානක බව, අවදානම අඩුකර ගනීමට එක්වන්ව කටයුතු කිරීම නොවෙද? ලෝක බලවතා වන ජනධිපති ට්‍රම්ප්ට හා ඔහුගේ බිරියට කොරෝනා වැලැඳුණා නම් අප වැනි රටක වසියන්ට කොරෝනාව වැලැඳීම මොන ප්‍රශ්නයක්ද වැනි බොළඳ අමනොඥ තර්ක නගනු වෙනුවට උද්ගත වී ඇති තත්වය හමුවේ නිර්භීතව, ප්‍රායෝගිකව මුහුණ දීමට පුරුදු විය යුතු බවයි අපගේ හැඟීම.





**බුද්ධදාස ගලප්පත්ති**
bgalaps@gmail.com

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



## COME AND SEE

# කුරිරු යුගයක සටහන් රැගත් The Painted Bird

කලකට ඉහත ලොව විශිෂ්ටතම සිනමා උලෙළක් ලෙස හැඳින්වූ 'කාලෝ විවාරි' සිනමා උලෙළ පැවැත්වූයේ චෙකොස්ලෝවේකියාවේ ය. එය පැරණි සෝවියට් කඳවුරේ රටකි. මෙයට දශක කිහිපයකට පෙර ලෝක බලවතුන්ගේ බලතුලනය පැවති සමයේ, මේ පැරණි සෝවියට් බලකඳවුර පිහිටියේ යුරෝපයේ නැගෙනහිරට වන්නට ය. පසු කලෙක සෝවියට් කඳවුරේ බිඳ වැටීමත් සමඟ නැගෙනහිර යුරෝපයේ සිතියම යළි වෙනස් වූ අතර එක්ව සිටි චෙක් ජනරජය සහ ස්ලෝවැකියාව දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු දෙරටක් බවට පත් විය.

එයින් වසර ගණනාවකට එපිට, එනම් 1962 වසරේ සිට 1968 කාලය දක්වාද චෙකොස්ලෝවැකියාවේ පිබිදීමක් ඇති විය. ප්‍රාග් (Prague) වසන්තය ලෙසින් හැඳින්වූ මේ නව පිබිදීම හරහා 'සිනමා ගරයිටි' නමින් අලුත් සංවිධානයක් බිහි විණ. එයින් ලොවට අලුත් සිනමාකරුවෝ රැසක් බිහි වූහ. මයිලස් ෆෝමන්, අයිවන් සෆාරි, ජිරි මැන්සිල් ආදි තරුණ සිනමාකරුවන් රැසක් ම චෙකොස්ලෝවැකියාව හරහා ලෝකය හඳුනා ගත්තේ එයින් පසුවය. 1966 වසරේ ඇකඩමි සම්මාන උලෙළේ හොඳම විදෙස් චිත්‍රපටයට හිමි සම්මානය manzil ගේ causley watch train චිත්‍රපටය දිනා ගැනීමත් සමඟ චෙක් තරුණ සිනමාකරුවන් පිළිබඳ ලෝකයේ ඇස් ඇරිණ. ඒ වන තෙක් චෙකොස්ලෝවැකියානු සිනමාව යනු කවරක් දැයි බොහෝ දෙනා දැන සිටියේ නැත. එය රුසියානු සිනමාව අබිබවා ඉදිරියට ගිය වග බොහෝ සිනමා ප්‍රේක්ෂකයන් දැනගත්තේ එම සම්මානය දිනා ගැනීමත් සමගය.

මේ නැගී සිටීමට එරෙහිව සෝවියට් දේශය ඉතා ඉක්මනින් ඔවුන්ගේ යකඩ හස්තය පැතිර වූයේය. සෝවියට් ආක්‍රමණයත් සමග චෙකොස්ලෝවැකියා සිනමා වසන්තය නිමාවූයේ 1968 වසරේදීය.

මේ සිදුවීම වන විට චෙකොස්ලෝවැකියානු සිනමාකරු මයිලස් ෆෝමන් සිටියේ එයින් සැතපුම් ගණනක් ඈත කාන්ස් සිනමා උලෙළට සහභාගී වෙමිනි. ඔහු යළිත් සිය මව්බිමට පැමිණියේ නැත. වහා ඇමරිකාවට පලා ගියේය. පසු කලෙක ඇමරිකානු සිනමාවේ බිහි වූ විශිෂ්ට සිනමා කෘතීන් ලෙස අප හඳුනා ගනු ලබන one flew over The cuckoo's nest, hair, right time, වැනි දැවැන්ත හා ශ්‍රේෂ්ඨ නිර්මාණ ඔහු අතින් බිහි වුණේ මේ පලා යෑමෙන් පසුවය.

මේ සතියේ මගේ සිනමා සටහනට පාදක කර කරගන්නේ අලුත් චෙක් චිත්‍රපටයකි. මේ වන විට චෙකොස්ලෝවෙකියාව නමින් රටක් නොමැති අතර එක් කොටසක් චෙක් දේශයට ද අනිත් කොටස ස්ලෝවැකියාව ට ද අයත් ය. 'the painted bird' නමැති මේ චිත්‍රපටය 'චෙක්' චිත්‍රපටයකි.

මෙම චිත්‍රපටයේ දීර්ඝ කාලය මිනිත්තු 169 කි. මෙහි ඇතැම් ජවනිකා අතිශයින් ජුගුප්සාජනකය. චිත්‍රපටය පිළිබඳ මගේ පූර්ව මතය නම්, මෙම චිත්‍රපටය අප නොදන්නා කතාවක් අනාවරණය කරන බැවින් මේ සම්බන්ධයෙන් මට තිබුණේ තීන්දු දෙකකි. එකක් මේ කෲර අත්දැකීම තවදුරටත් නොවිඳ සිනමාහලෙන් බැහැරව යා යුතුය. දෙවැන්න මේ දරුවාගේ නොඑසේ නම් 'ජොස්කා' ගේ ඉරණම මුළු මහත් මානව සංහතියේ ම අප නොදන්නා කතාවක් හෙළි කරන බැවින් එහි ප්‍රචණ්ඩත්වය සහ ජුගුප්සාජනක බව පසෙකලා මෙය අවසානය දක්වා විඳගැනීම ය. මා කළේ ඉන් දෙවැන්න ය.

The Painted Bird චිත්‍රපටයට පාදක වනුයේ ජොස්කා නම් යුදෙව් දරුවෙකි. ඔහුට වයස අවුරුදු දහයකි. මව්පියන් විසින් ජොස්කා ඔහුගේ නැන්දණිය ළඟට යවනු ලබන්නේ වඩාත් හොඳ ජීවන තත්ත්වයක් ලබා දීමේ අරමුණෙනි. එහෙත් නැන්දණියගේ හදිසි අභාවය සමග අතරමං වෙන ඒ වන විටද ඔහු කුඩා දරුවකු වන ජොස්කාට යන එන මං නැති වූ බැවින් ඔහු තම මව්පියන් සොයා ආපසු එන්නට පටන් ගනී. ඔහුට එන්නට තිබෙන්නේ මහා දුරකතර ගෙවාගෙන පා ගමනිනි. ඔහු මේ පා ගමනේදී විඳින වේදනා වචනයෙන් විස්තර කළ නොහැකිය. ඔහුට මුලින්ම හමු වන ගම්මානයේ ගැමියන් අතින් ඔහු හිරිහැරයට පාත්‍ර වේ. මේ හිරිහැරයට පාත්‍ර වන කුඩා දරුවා මන්ත්‍ර කාරියක වන මාර්තා විසින් මිලදී ගන්නේ ඇගේ බැළමෙහෙවර කිරීම සඳහාය. ඇය ගැමියන්ට මේ කුඩා දරුවා හඳුන්වා දෙන්නේ යක්ෂයකු ආරූඪ වූ අයකු ලෙසය. ඇය දකින විටත් මේ නන්නාඳුනන කුඩා දරුවා ගෙල තෙක් වළ දමා කපුටන් අතින් හිංසනයට පත් වෙමින් සිටියේය.

මාර්තාගෙන් පසු ජොස්කා හසුවන්නේ කම්හලක සේවකයන් අතටය. එහි හිමිකරුගේ බිරිය ඇගේ මියගිය පුතාට තරමට ජොස්කා ට ආදරය කරන්නේ ඔහු තම මිය ගිය පුතුගේ වයසේ වන බැවිනි. නමුත් ඇගේ සැමියා ඇයව නිකරුණේ සැක කරයි. මෙම මිනිසා කොතරම් කුර දැයි කිවහොත් තව මිනිසකුට පහර දෙන්නේ ඇසක් ගැලවී විසි වන්නටය. මේ ආකාරයෙන් මේ කුඩා දරුවා තම මව්පියන් සොයා යන ගමන පුරාම අප දකිනුයේ මිනිසුන්ගේ යහපත් ගතිගුණවලට වඩා ප්‍රචණ්ඩ වූ රෞද්‍ර ගති පැවතුම්වලට ලක්වන අයුරු ය. මේ බොහෝ දෙනා නූගතුන් යයි අපි සලකමු. නිරන්තරයෙන් විවිධ අතවරවලට කුඩා දරුවාට මුහුණ පාන්නට සිදු වේ. වරෙක ඔහු අසු වන්නේ හිට්ලර්ගේ නාසි හමුදා සේනාංකයට ය. එහි බැළමෙහෙවර කමට මේ දරුවා





යොදා ගනී. එයින් පසු හසුවුණේ රුසියානු හමුදාවට ය. ඔහුට දක්නට ලැබෙන්නේ යුද්ධයයි. එහි කෲරත්වයයි.

අවසානයේ මේ කුඩා දරුවා අනාථ කඳවුරකට යොමු වේ. එහිදී දිගු කලකට පසු මේ දරුවාගේ පියා ඔහුට මුණ ගැසේ. කුඩා දරුවාට තවදුරටත් තාත්තා ගැන ආදරයක් නැත. තමාව සහමුලින්ම අමතක කර දැමුවායැයි ඔහු තුළ ඇත්තේ තාත්තා කෙරෙහි විරෝධයකි. මේ නිසාම තාත්තා ඉදිරියේ කුඩා ජොස්කා ගොළුවත පුරයි. තාත්තගේ එකම පැනය අවම වශයෙන් ජොස්කාට සිය නම හෝ මතක ඇති දැයි විමසීමටය. දරුවා කිසිවකටත් පිළිතුරු දෙන්නේ නැත. අවසානයේ සිර කඳවුරෙන් තාත්තා කුඩා දරුවාව ද රැගෙන බස් රථයකට ගොඩ වෙයි. මිනිසකුට මුහුණ දිය නොහැකි තරම් කෲර අත්දැකීම්වලට මුහුණ දී සිටින දරුවා බස්රියේ කවුළුව අසල අසුනේ හිඳින විට යාබද අසුනේ සිටින තාත්තා තද නින්දකය. ජොස්කා තාත්තාගේ අතක ඇති පච්ච සලකුණක් දකියි. එය නාසි හමුදාව විසින් යුදෙව්වන් හඳුනා ගැනීමට කරන ලද සලකුණයි. සලකුණ දකින දරුවාගේ සිතිවිලි වෙනස් වේ. ඔහුට මුල්වරට තාත්තා ගැන අනුකම්පාවක් ඇතිවේ. නමුත් ඔහු තාත්තා පුබුදුවා කිසිවක් කථා කරන්නේ නැත. ඒ වෙනුවට අසුනට යාබද වීදුරුවේ ඇති දූවිලි මත ජොස්කා තම නම සටහන් කරයි. එවිට තාත්තාට අවදි වූ විට පෙනෙන්නේ මේ කුඩා දරුවා තමාගේ නම ලියා ඇති බවයි.

the painted bird සිනමාපටය නිර්මාණය කරන ලද්දේ චෙක් සිනමාකරුවකු වන 'වක්ලව් මාර්හෝල්' විසිනි. මේ වන විට හැට හැවිරිදි වියේ පසුවන ඔහු ප්‍රාග් නගරයේ උපත ලද්දෙකි. The Painted Bird ඔහුගේ තෙවන චිත්‍රපටයයි. එහි තිර නාටකය ද අධ්‍යක්ෂවරයාගේමය. මේ සඳහා ඔහු පාදක කරගන්නේ පෝලන්ත ජාතික සාහිත්‍යධරයකු වූ ජර්ජි කොසින්ස්කි විසින් 1965 වසරේ ලියන ලද ආන්දෝලනාත්මක ග්‍රන්ථයකි. කොසින්ස්කි ද දෙවන මහා සංග්‍රාම ලෝක යුද සමයේ දරුවකුව සිටියදී බිහිසුණු අත්දැකීම්වලට මුහුණ දුන්නෙකි. පසුව ඔහු ඇමරිකාවට යන අතර එහි දී නවකතාකරුවකු ලෙස පතළ විය. යුද්ධය පිළිබඳව ළමා වියේදී ඔහු දුටු බියකරු අත්දැකීම්වලින් ජීවිත කාලය පුරාම මිදෙන්නට නොහැකි වූ ඔහු පනස් හත් හැවිරිදි වියේදී සිය දිවි නසා ගත්තේය.

මෙකී සිනමා කෘතිය පසුගිය වසරේ තිරගත කළ චිත්‍රපට අතර මහත් ආන්දෝලනයට ලක් වූයේ එහි එන කෲර හා ඉතාම දරුණු රූප ජවනිකා සමගය. එය මතුපිටින් කියවනවාට වඩා බිහිසුණු මිනිසුන් පිළිබඳ අනාවරණයකි. කුඩා දරුවකු ජීවිතය අයදිමින් යන ගමන සහ ඉතා කෲර අත්දැකීම් සිනමාකරු මතු කරනුයේ ද ඉතා බිහිසුණු අන්දමිනි. එහෙත් එහි සිදුවන කිසිවක් හෝ සිනමාකරු විසින් මවාපානු ලබනුයේ කිසිසේත් ම එයින් බැහැරව, එයින් වියුක්තව විමසිය යුතු අන්දමට නම් නොවේ. මේ යුරෝපයේම එක් අවදියකි. මානව ශිෂ්ටාචාරයේ දියුණු යුගයක් යයි සැලකෙන විසිවන සියවසේ මුල් දශකයයි. පුදුමය නම් මේ යුද්ධයෙන් තොර කාලයේදීත් මනුෂ්‍යත්වයට ඉඩක් නොමැති වීමයි. සිනමාකරු තෝරා ගන්නේ කළුසුදු රූපරාමු වීම විශේෂත්වයකි. චරිත මෙන්ම දරුවා ගමන් කරන පරිසරය හා එහි සිදුවීම් අතර ගොඩනැගෙන අඳුරු ගූඪ ස්වභාවයට මහත් රුකුලක් සපයන්නේ මෙම කළු සුදු රූපාවලියයි. චිත්‍රපටයෙහි සාර්ථකත්වයට මා විශ්වාස කරන අන්දමට වැඩිම බලපෑමක් වන්නේ එහි වරින්වර අනවශ්‍ය ලෙස දිග්ගැස්සෙන තිර නාටකය නොව මෙකී විශිෂ්ටතම රූප රාමු පද්ධතියයි.

විසිවන සියවසේ මුල් දශකය පමණ වන විටත් සමහරවිට අද පවා යුරෝපයේ ග්‍රාමීය මට්ටමෙන් පවත්නා ඇතැම් ග්‍රෝත්‍රික ලක්ෂණ සිනමාකරු අපූල ලෙසින් ඉස්මතු කරයි. සිනමාකරු මේ ගෝත්‍රික ලක්ෂණ සහිත නූගත් මිනිසුන්ගෙන් පසු සමීප කරවන්නේ දියුණු සමාජය තුළ යුද වදින රුසියානු සහ ජර්මානු සෙබළුන්ගේ ක්‍රියා කලාපය වෙතය. මේ සියලු ක්‍රියාකාරකම් මනසින් සසඳන්නට ඔහු අපට නොකියා කියයි. තවමත් වර්ණ චිත්‍රපට දහසක් අතර පවා ජීවිතයේ ගැඹුර හා අත්දැකීම් සහසක් කියා පාන්නට කළු සුදු රූපාවලියක ඇති බලවත්කම සිනමාකරු අපට පසක් කර සිටී.



අරුණ ගුණරත්න

---

# කිරි විතරක් හොඳටම ඇති

වෙද නළාව

ඔන්න හොඳට මතක තියාගන්න බබාට මාස හයක් වෙනකල් මව් කිරි ඇරෙන්න වෙන කිසිම දෙයක් දෙන්න එපා. දොස්තර කෙනකු නියම කරන බෙහෙතක් හැරුණම වෙන මොකුත් ම දෙන්න බෑ. ඒ කියන්නෙ වතුරවත් බෑ." මිඩ් වයිෆ් මිස් යන්න ගියේ එහෙම කියාගෙන.

"ඔය කිවුවට අපි නම් දරුවන්ට වතුර විතරක් නෙවෙයි, කොත්තමල්ලි වතුර එහෙමත් දුන්නා. මොකෝ එහෙම දුන්නා කියලා ඒ කාලෙ ළමයින්ට මොකවත් නරකක් වුණා ද? අනික වතුර නැතුව කොහොමද දරුවෙක් වැඩෙන්නේ." ආච්චි අම්මා දෝස් මුරය පටන් ගත්තා.

මව් කිරි ගැන දැනගත යුතු වැදගත් ම කාරනාව තමයි දරුවකුට පළමුවෙනි මාස හයේදි ඕනෑ කරන හැම දෙයක්ම මව් කිරිවලින් ලැබෙනවා කියන එක. ඒ කියන්නේ හරියටම ඇතිවෙන්න මාස හයක් මව්කිරි දෙනවා නම් ඒ දරුවාගේ පෝෂණයේ කිසිම අඩුපාඩුවක් වෙන්නේ නෑ. ඒ වගේම තමයි මේ කාරණය හරියන්නේ දරුවෙක් ඉපදිලා මාස හයක් ගතවෙනකල් විතරයි. ඊට පස්සෙ එයාට අමතර ආහාර දුන්නේ නැතිනම් එයාට මව් කිරිවලින් විතරක් ඕන කරන දේවල් ලබාගන්න අමාරුයි. ඒනිසා දරුවකුට හොඳ පෝෂණයක් දෙන්න ඕන නම් මුල් මාස හය මව් කිරි විතරක් හරියටම දෙන්නත්, මාස හය ඉවරවෙනකොටම අමතර ආහාර පටන් ගන්නත් ලෑස්ති වෙන්න වෙනවා.

ඊළඟට තවත් වැදගත් කාරණාවක් තමයි අලුත ඉපදුණු දරුවකුට ලෙඩ රෝග හැදෙන්න තියෙන ඉඩ වැඩිහිටි කෙනකුට වඩා වැඩියි. එයාව ලෙඩ කරන්න පොඩි විෂබීජයකට වුණත් පුළුවනි. මව් කිරි ඇරෙන්න වෙන දෙයක් දෙනවා කියන්නෙම එයාගෙ ඇඟට විෂබීජ ඇතුළුවෙන්න තියෙන අවදානම වැඩි කරනවා කියන එක.

පොඩ්ඩක් හිතල බලන්න, වෙන බීමක් දෙන කොට අපි ඒව හදන භාජනේ ඉඳල පොවන බෝතලේ හැන්ද වගේ හැම දෙයක් ම හරියට පිරිසුදු කරගන්න බැරි වුණොත් හරි, පොඩි අතපසුවීමක් වුණොත් හරි ඒ වැඩේ කෙළවර වෙන්නෙ බබා ලෙඩ වෙලා.

ඒත් මව්කිරි විතරක් ම දෙන බබෙක්ට එහෙම වෙන්න තියෙන ඉඩ කඩ හරිම අඩුයි. ඇත්තම කියනවා නම් පහුගිය අවුරුදු ගානක් තිස්සෙ අපේ රටේ පාචනය හැදුණු ඒ වගේම පාචනය නිසා මැරුණු බබාලා ගාන ගොඩක් අඩු වෙලා තියෙනවා. ඒකට ලොකුම හේතුවක් තමයි අපේ බබාලට මාස හයක් යනකල් මව්කිරි විතරක් ම දෙන්න අපේ අම්මලා පුරුදු වුණ එක.

එතකොට මාස හයකට පස්සෙ? මාස හයක් විතර යනකොට බබාගෙ ඇඟ විෂබීජවලට ඔරොත්තු දෙන්න පුළුවන් ගානට හැදෙන නිසා එතකොට එයා ලෙඩ වෙනව අඩුයි. ඒ වගේම තමයි බබාට මව් කිරි ඇරෙන්න වෙන කෑම ජාති දිරවන්න පුළුවන් වෙන්නත් මාස හයක් විතර යනවා.

අනිත් කාරනේ තමයි මව් කිරි දෙනකොට බබා ඉබේම උණුසුම් වෙන නිසා එයාගෙ ඇඟ සීතල වෙන්නෙ නෑ. ඒ වගෙම බබාගේ මුහුණේ පේශිවලට ඉබේම ව්‍යායාමත් ලැබෙන නිසා එයාට ලස්සනට හිනාවෙන්නත් පුළුවන් වෙනවා.

'එතකොට බබෙකුට වතුර ඕනෙ නැද්ද' කියන එකයි ඊළඟ ප්‍රශ්නය. බබෙකුට වතුර ගොඩක් ඕනෙ.


එහෙම නම් වතුර නොදී බබාව හදන්නේ කොහොමද ? ඇත්තටම කියනවා නම් මව් කිරිවලින් වැඩි හරියක් ම, ඒ කියන්නෙ 80%ක් විතරම වතුර තමයි. නිකම්ම වතුර නෙවෙයි. විෂබීජ මොකුත්ම නැති පිරිසුදු වතුර. අන්න ඒ නිසා හොඳින් මව් කිරි බොන දරුවකුට එයාට ඕන කරන වතුර ටික මවුකිරිවලින් විතරක් ම ලැබෙනවා. ඒ විතරක් නෙවෙයි ඒ වතුරවල පිරිසුදුකම ගැන ප්‍රශ්නයකුත් නෑ.

ඒ නිසා බබා ලෙඩ වෙනවත් අඩුයි. ලෙඩ නොවෙන නිසා බබාගෙ බරත් හොඳින් වැඩිවෙනවා. අන්න ඒ නිසා බබාට මව් කිරි ඇරෙන්න වෙන මොනවා හරි කෑමක් බීමක් දෙන්න ඕන් නම් මුල් මාස හය ඉවසලා ඊට පස්සෙ දෙන එක තමයි හොඳ.



වෛද්‍ය නුවන් තොටවත්ත





ටොම්සන් මහත්තයා

# අධ්‍යාපන පොලිතීන්

ටොම්සන් මහත්තයාත්, ඇම්බන් මහත්තයාත්, උන්නැහේත් යමින් සිටියේ පාසලකටය. ඉගෙන ගන්නට නොවේ. පාසලේ ලොකු මහත්තයාගේ ඉල්ලීමකටය. ලොකු මහත්තයා එන්න කීවේ මොකටද කියා තිදෙනාම දන්නේ නැත.

"මං මේ තකහනියක් එන්න කිව්වේ ටොම්සන් මහත්තයා... අපේ මේ ඉස්කෝලේ පිරිසුදුව තියා ගන්න අපි ලොකු වෙහෙසක් ගන්නවානේ... අමාත්‍යාංශයෙනුත් අපට කියලා එවලා තියෙන්නේ පාසල පොලිතීන් රහිත කලාපයක් කරන්න කියලා..." කියා ලොකු මහත්තයා කීවේය.

"ඒක ලෝකෙම තියෙන ප්‍රශ්නයක් නේ ලොකු මහත්තයා... ගොඩබිම විතරක් නෙවෙයි, මහ මුහුදත් අපවිත්‍ර වෙලා කියලා මං පහු ගිය දාක දැක්කා පත්තරේක තිබුණා පින්තූරත් එක්ක... " කියා ටොම්සන් මහත්තයා කීවේය.

විදුහල්පතිතුමා තිදෙනාම කැඳවා ගෙන පාසල පුරා ගියේය. ආපණ ශාලාවට ගිය ඔවුහු කුරක්කන් රොටියක් කා, තේ කහට එකක් බිව්වහ.

"මං මේ දැක්කමයි ලොකු මහත්තයා... ඉස්කෝලෙක කැන්ටින් එකක කුරක්කන් රොටී විකුණනවා..." කියා ඇම්බන් මහත්තයා කීවේය. උන්නැහේද එම කීම අනුමත කරමින් හිස වැනුවේය.

"මේක නේ ඇම්බන් මහත්තයා... අපි ළමයින්ට අපේ රටේ දේ පුරුදු කරන්න ඕනෑ... ඉස්කෝලේ තියෙන්නේ ඔය පෙළපොත්වල තියෙන දේ විතරක් උගන්වන්න නෙවෙයිනේ... ජීවත් වෙන්න උගන්නන එක තමයි වැදගත්ම දේ..."

"හොඳයි ඉතින් ලොකු මහත්තයා... අපෙන් මොනවද මේ ගැන බලාපොරොත්තු වෙන්නේ...? විශේෂ උදව්වක් තියෙනවා නම් කියන්න... අපි මඟ ඇරලා යන්නේ නෑ..." කියා උන්නැහේ කීවේය.

"ලබන සතියේ අපි ඉස්කෝලේ තියෙනවා ලොකු ශ්‍රමදානයක්... ඉස්කෝලේ සම්පූර්ණයෙන්ම පිරිසුදු කරන්න... මේ ගැන පත්තරේ ලොකු ප්‍රසිද්ධියක් දෙන්න ඕනෑ... ඒක ටොම්සන් මහත්තයාගෙන් බලාපොරොත්තු වෙන එක උදව්වක්... අනික මේ ශ්‍රමදානයට තුන් දෙනාම එන්නත් ඕනෑ..."

තිදෙනාම පාසලින් පිට වූයේ මහත් සතුටකිනි.

"මේක තමයි වෙන්න ඕනැ විදිහ... ඉස්කෝලෙන් තමයි පරිසරය පිරිසුදුව තබා ගැනීම පටන් ගන්න ඕනෑ... ඉස්කෝලේ ළමයි තමයි ඊළඟට සමාජයේ පුරවැසියන් වෙන්නේ... " කියා උන්නැහේ යන ගමන් කීවේය.

"අපි ලබන සතියේ ඉසුරුපායට යනවානේ තොරතුරු මධ්‍යස්ථානෙට. එතකොට මේ ඉස්කෝලේ ගැනත් නිලධාරීන්ට කියන්න ඕනෑ... වැඩ කරන තැනකට නිසි සැලකිල්ල ලැබෙන්න ඕනැ නේ... " කියා ටොම්සන් මහත්තයා කීවේය.

ඊළඟ සතියේ ටොම්සන් මහත්තයා ඇම්බන් මහත්තයාත් සමඟ ඉසුරුපායට ගියේය. දැන් මහජන දිනය සඳුදා නිසා සෙනඟ ඒ තරම් සිටියේ ද නැත.

"අපි සෞඛ්‍ය අංශය පැත්තෙත් යනවද ටොම්සන් මහත්තයා...?" කියා ඇම්බන් මහත්තයා ඇසුවේය.

"නෑ ඉතින් මොකටද කරදර කරන්නේ... ඒ අංශවල බරට වැඩ ඇති නේ... අර තොරතුරු ටික අරගෙන ඉවර වෙලා අපි යමු කැන්ටිමට මොනවා හරි කන්න..."

දෙදෙනාම තොරතුරු කාර්යාලයට ගියහ. ටොම්සන් මහත්තයා එතැනින් ඉල්ලුම් පත්‍රයක් ඉල්ලා ගෙන එය පුරවා භාර දුන්නේය.

"අපි යමු එහෙනම් මොනවා හරි කන්න... මට නම් දැන් හොඳටම බඩගිනියි. "

දෙදෙනාම ඉසුරුපායේ කැන්ටිමට ගියහ.

"මොනවද කන්නේ ටොම්සන් මහත්තයා... මේ තම්බපු කඩල ටිකක් කමුද? ටිකක් කෑවත් බඩ පිරෙනවානේ..."

කැන්ටිමේ සේවිකාව පිඟානක් ගෙන එයට ලන්ච් ෂීට් එකක් දමන්නට අතට ගත්තා පමණි. ටොම්සන් මහත්තයා අත දිගු කර එය නැවැත්වූයේය.

"එපා... අපි දෙන්නටම ඔය පොලිතීන් කොළ දාන්න එපා... ඔය පෝසිලේන් පිඟාන උණු වතුරෙන් හෝදලා ගන්න..." කියා ටොම්සන් මහත්තයා කීවේය. සේවිකාව අන්දමන්ද වී ටොම්සන් මහත්තයාගේ මුහුණ දෙස බැලුවාය.

"පොලිතීන් කොළ දාලා කෑම දුන්නාම අපට ඒක පිරිසුදු කරන්න ලේසියි. ඒකයි. නැතිනම් අපි මේ ඉඳුල් පිඟන් හෝදන්න ඕනෑ නේ..." කියා සේවිකාව කීවාය.

"නෑ... එහෙම කරදර වෙන්න එපා... කාලා ඉවර වෙලා අපි පිඟාන් දෙකත් හෝදලා දෙන්නම්... දැන් ඔය පිඟන් දෙක උණු වතුරෙන් හෝදලා කඩල ටික බෙදලා දෙන්න..."

ටොම්සන් මහත්තයාත්, ඇම්බන් මහත්තයාත් කඩල පිඟන් දෙකත් ගෙන ගොස් ඉඳ ගෙන කන්නට පටන් ගත්තහ.


"මං මේ බැලුවේ ටොම්සන් මහත්තයා... අර හැම තැනම කෑම කන්නේ පොලිතීන් කොළ දාලා නේ. අර බලන්න සමහරු කෑම ඉතිරි කරලා... එතකොට පොලිතීන් කොළේ අයින් කරන්නෙත් කොහොමද?" ඇම්බන් මහත්තයා කීවේය.

"ඒක තමයි... අපි කාලා ඉවර වෙලා පිඟන් දෙකත් හෝදලා තියලා යමු... පෝසිලේන් පිඟාන උණු වතුරෙන් හේදුවාම තියෙන පිරිසුදු කම තියෙනවාද පොලිතීන් කොළවල... මේකේ වැඩ කරන කාටවත් ඒ ගැන වගේ වගක් නෑ... අර ඉස්කෝල පොලිතීන් රහිත කලාපයක් කරන්න කියලා ඉස්කෝලවලට ලියුම් යවන නෝනලා මහත්තුරුත් මෙහේදි කෑම කන්නේ පොලිතීන් කොළ දාලා වෙන්න ඇති. මේවා කාටද ඉතින් කියන්නේ...?" ටොම්සන් මහත්තයා කීවේ බොහොම කනගාටු වෙමිනි.

"කාට කියන්නද? අර ගමේ කතාවක් තියෙන්නේ... දේවාලේ කපුවාට දේවාලේ පහරන්න අයිතියක් තියෙනවා කියලා... ඒ වගේ තමයි... ඒ වුණාට අලුත් අධ්‍යාපන ලොක්කොත් මේවා මේ විදිහටම කර ගෙන යන්න ඉඩ දෙනවාද කියන එක තමයි මට තියෙන ප්‍රශ්නේ... නැද්ද ටොම්සන් මහත්තයා...?"



**බන්දුල පී. දයාරත්න**





කැදැල්ලක නෙත

# රන් රංගිර

බිනරාධනාව තුටුපහටු සිතින් බාර ගත්තද, උදය දවල් දෙවේල උදෙසා අලුයම තුනට වත් අවදි විය යුතුය. එය හිරිහැරයකැයි නොසිතිණ. එකම දුක ළිප ගින්දරේ දැවෙන අතරතුර තවත් දවසක් බිහිකරනු වස්, අහස පොළොව උහුලන්නාවූ අපමණ වැර වෑයමෙන් නිහඬ සාක්ෂි කරුවකු වන්නට ඉසිඹුවක් නොලැබීමයි. පායා නැඟෙන හිරුත් එක්ක සිදු වන වර්ණ විපර්යාසය මහත්ම අසිරියක් නොවේද? අපේ දරුවන්ට අද දවසේ නැතුවම බැරි විද්‍යුත් මෙවලම් පසෙක තබා අහස පොළොව නරඹන්නට කාලය සොයාගන්නේ නම් කොතරම් කදිම ද?

එකල්හි මනුස්ස අප මේ පරිසරයේ තවත් අංශුවක් විනා මුළු මහත් පෘථිවියේම අධිපතියා නොවන බව වටහා ගත හැකිය. පසක් කොට ගත හැකිය.

රංගිරේ 'අනුරාධ කපුකොටුව' නිවේදක මිතුරා සුපුරුදු ළෙන්ගතුකමින් මා පිළිගත්තේය. 'ශනිදා නවෝදය' තුළින් ඔහු සාහිත්‍ය කලාවට සිදු කරන්නා වූ මෙහෙය අප අගය කළ යුතුය. දෙපැයක ගුවන්විදුලි අවකාශය අමිලය. එමෙන් ම පාඨකයා රසිකයා සහ නිර්මාණකරුවා යා කරන ඒදණ්ඩකි. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන්හි සාහිත්‍ය කලා අවකාශයන් කෙමෙන් හැකිලෙමින් පටු වන අතරේ, අනුරාධ කපුකොටුව කාලාන්තරයක් මුළුල්ලේ සිදු කරන්නා වූ මේ සත්කාරය සැබැවින්ම පැසසුම් කටයුතු ය.

උදෑසන ආහාරය ලබා ගත් ආපණ ශාලාව ඉදිරිපිට සිඟමන් යදින මව සහ දියණිය පිළිබඳව ද, ඔවුන්ගේ කුසගිනි නිවන්නට මා කළ ඇබිත්තන් උපකාරයද ආගිය කතා බහේ දී හෙළි කළෙමි. එහෙත් ඔහු සිය වැඩසටහන එයින්ම අරඹනු ඇතැයි මම කිසිසේත් නොසිතුවෙමි.

අප යමකුට උපකාර කළ යුත්තේ අඬබෙර ගසමින් නොවේ. එයින් උපකාර ලබන තැනැත්තාට එක්තරා අවමානයක් අත්පත් නොවේද? එහෙයින් මම තරමක අපහසුතාවට පත් වීමි.

"අම්මා ඉතින් අසරණ වෙච්ච කෙනකුට පුංචි උදව්වක් කළා කියලා ඒ කෙනාගේ අසරණකම ඒකෙන් නැතිවෙනවද? අම්මට ත්‍රිල් එකක් පොඩ් ෆන් එකක් විතරයි." කී මගේ දෙවැන්නා සරදම් කරන කළ තෙවැන්නා ද, සිව්වැන්නා ද, පස්වැන්නා ද හිස් සලමින් හිනැහෙති. එවන් ප්‍රතිචාර මගේ ස්වභාවය වෙනස් කරන්නට සමත් නොවෙතත් එහි ඇත්තක් ඇතැයි හැඟේ.

දානය හෝ පරිත්‍යාගය කුසල් එක්රැස් කිරීමේ ද, නිවනට ළඟා වීමේ ද මගක් විනා මනුෂ්‍යත්වයේ මහිමය කියාපාන්නක් නොවන සෙයකි. සැබැවින්ම පරිත්‍යාගශීලියා ගේ යසස වැඩෙන්නාහාම, පරිත්‍යාග ලාභියාගේ ආත්ම ගරුත්වය ද ආරක්ෂා විය යුතුය.

එහෙත් එහිදී එසේ සිදු නොවෙයි. පරිත්‍යාගශීලියාගේ යසස වැඩෙන්නේම පරිත්‍යාග ලාභියාගේ අභිමානය සුණු විසුණු කර දමමිනි. එසේනම් ආදේශ කළ යුත්තේ 'යසස' වෙනුවට 'සතුට' නොවේද? අනෙක් අතට අසරණ වූවකුට නැඟී සිටින්නට මගක් සොයා, පාදා දෙනවා වෙනුවට ආහාරයෙන්, වස්ත්‍රයෙන් ඒ හැටි පලක් වේද?

ජානකී කරුණාරත්න සොහොයුරිය ශ්‍රාවිකාවක ලෙස අතිශයින් අගනා අයුරින් අපේ කතාබහට එක් වූවාය. එමෙන්ම පාසල් මිතුරියක වූ නිර්මලා 'ආදරණීය නිම්මි' අක්කාද ඒ පැරණි මතක හාරා අවුස්සමින් සැහැල්ලුව ද සොම්නස ද එක් කළාය.

ඇතිපොළ මංගල හිමි සාහිත්‍යය පිළිබඳව නිරන්තරයෙන් අවදියෙන් සිටිමින් අපේ සංවාදයට ගැඹුරු අරුතක් එක් කළ බව ගෞරවාදරයෙන් සිහිපත් කරමි.

රංගිරෙන් සමුගෙන ආපසු එන අතරේ ද සංවේදී සිත් සතන් මේසා හිඟ මන්දැයි විමසූ ශ්‍රාවකයාගේ හඬ මට ඇසිණ.

පරිසරයෙන් ඈත් වන තරමට අපේ සංවේදී භාවය ද වියැකෙන බව මට සිතිණ.

සිය මවගේ ඇකයේ සුරතල් වෙමින් මා දිගු කළ ආහාර මල්ල ඉතා ආශාවෙන්, උනන්දුවෙන් බාරගත් දැරියගේ දිදුලන දෑස මගේ දෑසට කඳුළ කැන්දයි. ඇගේ උරුමය මහමග නොවේ.!

ඇයට හෙටක්?



**ශාන්ති දිසානායක**

# බබාලන්තයේ විකිණෙන බබාලා

නොල්ලි කතාන්දර

බබාලන්තය කියන්නේ රටකි. පුංචි කාලයේ නරඹපු බබාලන්තය කාටූන් වැඩසටහනේ වගේම සියලු මැති ඇමති බබාලා සහ ජනතා බබාලා එහි ඉතාමත් සතුටින් වෙසෙති.

ජනාධිපති බබාගේ සුප්පුව ඇමති බබෙක් හැපීම, පොලිස් බබාලා අගමැති බබාලාගේ නැපි මාරු නොකිරීම, වයසක නිළි බබෙක් තරුණ ජනතා බබෙක් කසාද බැඳීම වැනි සරල කාරණා බබාලන්තයේ ඉතා වැදගත් කරුණු ලෙස සලකා ජනතා බබාලා විසින් සති ගණන් සමහර විට මාස ගණන් සාකච්ඡා කරති.

සරල සිද්ධිවලට රටේ ජනතා බබාලාගේ අවධානය වැඩිපුර ලැබීම නිසා අවධානය සහ නීතියේ ඇස යොමුවිය යුතු සංකීර්ණ කාරණා අතපසුවීම බබාලන්තයේ සාමාන්‍ය සිදුවීමකි.

මේ කතාව බබාලන්තයේ දේශපාලන බබාලා ගැන හෝ නළු නිළි බබාලා ගැන නොවේ. මෑතකදී ආරම්භ වී ජයටම කෙරීගෙන යන බබාලන්තයේ අලුත උපන් බබාලා කාසි කොළ, චෙක් කොළ හෝ ණයපත් ගෙවීම්වලට බබාලා නැති අම්මලා තාත්තලාට හදාගන්නට දෙන සාප්පුවක් ගැනය.

ඒ සාප්පුවේ අයිතිකාර මුදලාලි බබා කියන්නේ තමුන් ආරම්භ කොට තිබෙන්නේ ලෝකේ කොහේවත් නැති අලුත්ම පන්නේ සංකල්පයක් බවය.

බබාලන්තයේ සමහර ගැබිනි බබාලාට විවිධාකාර හේතු නිසා තමන්ගේ කුසයේ වැඩෙන බබා හදාවඩා ගැනීමට බැරිය. ඒ හේතු බොහොමයක් සාධාරණ හේතුය. ඒත් බබාලන්තයේ නීතියට අනුව ඒ බබාලාට යන්න කියන්නටද බැරි නිසා ඒ ගැබිනි බබාලා බොහොම අසරණ වෙති. එසේ අසරණවන ගැබිනි බබාලාට දරුවන් ලැබෙනකල් බලාගන්නා බවට පොරොන්දු වන මේ මුදලාලි බබා ඒ පොරොන්දුව අකුරටම ඉටුකරන්නේය. ඒ ගැබිනි බබාලා බලා ගන්න උපකාර ලෙස ජනතා බබාලාගෙන් ලැබෙන දාන මානාදියද උපකාරද මුදලාලි බබා සම සිතින් ඉවසන්නේය.

ඊට අමතරව ඉදහිට දවසක මූණුපොතේ තමන්ගේ සාප්පුව වෙනුවෙන්ම වෙන්වුණ පිටුවේ දැන්වීමක් දමා ගැබිනි බබාලාට ආහාර පානාදිය දමා දීමට ශීතකරනයක් පිනට දිය හැකි ජනතා බබාලාගෙන් ආධාර ඉල්ලන්නටද මේ මුදලාලි බබා අමතක නොකරයි.

තමන් මේ කරන්නේ සද්කාර්යයක් බවත්, අම්මලාගේ කුසයේම දිවි අහිමි වන්නට නියමිත දරුවන්ට ජීවිතයක් දෙන එක තමන් අදහන ආගමට අනුව මහත් පුණ්‍යකර්මයක් බවත් මේ මුදලාලි බබා නිරන්තරයෙන්ම මාධ්‍ය ඔස්සේ අදහස් ප්‍රකාශකර සිටියි. මූණු පොතේ දැන්වීම් පලකරමින් බබාලා ලබාගැනීමට කැමති ජනතා බබාලාට තම ආයතනය සමග ලියාපදිංචි වන ලෙස කියයි. එසේ ලියාපදිංචි වන ජනතා බබාලාට අලුත උපන් බබාලා ලබා දෙන්නේ බබාලන්තයේ නීතිය අනුව බවද මතක් කරදෙයි.

බබාලන්තයේ නීතිය අනුව අලුත උපන් බබාලා කුලවද්දා ගැනීමට ලබාගත හැක්කේ සෘජුව රජය මගින් පාලනය වන ආයතනයක් මගින් හෝ පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි/රාජ්‍ය අවසරය ලත් ආයතනයකින් විතරය. මේ මුදලාලි බබා තමන්ගේ ආයතනය එසේ ලියාපදිංචි වී ඇති බවක් හෝ එසේ ලියාපදිංචි වී ඇත්නම්, ලියාපදිංචි වී ඇති අංකයක් ගැන නොකියයි.

ඒ වෙනුවට තමන් සිදු කරන පුණ්‍යකර්මයන්ගේ බලවත් කම ගැනම කියවයි.

බබාලන්තයේ නීතියට අනුව කුලවද්දාගැනීම සඳහා දරුවකු ලබාගැනීම ඉතාම අපහසුය. සමහර විටෙක ඒ සඳහා මාස ගණනක් එහෙමත් නැත්නම් වසර ගණනක් බලා සිටීමට ද සිදු වේ. තමන්ගේම ලෙයින් උපන් බබාලා ඇති අයට වෙනත් බබාලා කුල වද්දා ගැනීමට නොහැකිය. නීතියේ හැටියට අවිවාහක අයටද බබාලා ලබාගැනීමට නොහැකිය. එකී මෙකී නොකී නීති රාශියකි.


ඒත් මේ මුදලාලි බබා ඒ කිසිම සාධකයක් නොබලාම බබාලා අරන් හදා ගැනීමට දෙයි. අලුත උපන් බබාලාට හුවමාරුවට මුදල්ද ලැබෙන බව කනින් කොනින් කියවෙයි.

මුදල් රැගෙන හෝ බබාලා නැති අයට ලේසි ක්‍රමයකින් බබාලා ලබාගන්නට හැකිනම් කොයිතරම් දෙයක්දැයි, ළඟ පෙනෙන දුර නොපෙනෙන සමහර ජනතා බබාලා ප්‍රසිද්ධියේ ප්‍රශ්න කරති.

ඒ ජනතා බබාලාට අමතක වී ඇති කරුණ නම් බබාලන්තය තියෙන්නේ ලෝකය ඇතුළේ බවය. ලෝකයේ අවයව ජාවාරම්වලට අලුත උපන් බබාලා යොදාගන්නා බවය. ඊටත් අමතරව අලුත උපන්දරුවන් මරා ඔවුන්ගේ ශරීර ඇතුලට මත්ද්‍රව්‍ය පුරවා සැක නොහිතෙන ප්‍රවාහන ක්‍රමයක් ලෙස මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට බබාලා යොදාගන්නා බවය.

මේ අගක් මුලක් නොදන්නා, කාසි කොළවලට අලුත උපන් බබාලා විකිණීමේ සාප්පුව ගැන බබාලන්තයේ පොලිස් බබාලා නීතිය ක්‍රියාත්මක කළයුතු කාලය එළඹ ඇති බව මගේ හැඟීමය.

මේ මුදලාලි බබාට රිංගා යා හැකි නීතියේ හිඩැස් තිබේ නම් ඒ හිඩැස් ඉක්මනින් වැසෙන තරමට නූපන් බබාලාගේ අනාගතය යම් තරමකට හෝ සුරක්ෂිත වනවා ඇත.



**දසුනි හෙට්ටිආරච්චි**



# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## සන්නාලියන් ජීවිතයයි මහන්නේ



හිරුටත් කලිනි ඇස් තරු කැට පිපෙන්නේ
නැතුවා නොවෙයි පිනි සීතල දැනෙන්නේ
දිවි ගැට ගහන්නයි තරගෙට දුවන්නේ
නැතුවද මැෂිමකට දොම්නස දැනෙන්නේ

දුක වැඩි වෙලාවට රහසේ කඳුළු සලා
වැඩිපුර වෙලාවක් හිටියෙම සිනහ වෙලා
විසිකර දමා දුටු සුන්දර සිහින තළා
මැෂිමක වේගයට තුණු විය උගස් කළා

දවසට ඉවර කර දිය යුතු ඉලක්කෙට
අත, පය, දෑස, හිත හරියට සකස් කොට
මැහුමක් ළඟ වුණත් විදසුන් වඩන්නට
නිවනක් නොවෙයි හැක වැටුපක් ලබන්නට

තිබුණත් කම්කටොලු සහ රෝ දුක් නේක
සතුටක් නොතැවරී තිබුණත් කිසි දේක
වැඩ ඉවරයක් නැතුවත් නිදිවර රෑක
බර නැත ගෙදරටත් රටටත් කිසි දාක


ඔරලෝසුවේ කටු කැරකෙන රටාවට
හැම දවසක්ම ගෙවුණත් එක කලාවට
ප්‍රේමය හිත පුරා ඉතිරෙන වෙලාවට
සමහරු හිතයි ගත හැකි බව මුළාවට

ලෝකය වෙනස් වන බව දැන උන්නාට
දකිනට ඉඩක් නැත එහි කළු සුදු පාට
රැවටී මුළාවක වැටුණා නම් කාට
මැෂිමත් වග කියන්නට ඕනෑ ඊට


පැය විසි හතරෙ වැඩි හරියක් නිදි වරලා
අහවර කරන ඇඟලුමකට මිල ගෙවලා
දහසින් බැඳි පියළි ඇති අය විළි වසලා
එතරම් උස සිහිනයක් වත් නැත බලලා

උපයන කාසියෙන් සරුවන විටෙක රට
එහි දිග පළල නොබැලූවත් කිසිම විට
රස්සාවලින් උස්මිටිකම් මනින කොට
'ගාමන්ට් ළමයි' හිටියේ හැමදාම යට

දිව සළු නොවෙයි මුදු ගත හැඩ කරන්නේ
රස මසවුළු නොමැත කුසයට වැටෙන්නේ
හිරු සඳු නගිනු බැසයනු නැත දකින්නේ
සන්නාලියන් ජීවිතයයි මහන්නේ



**දිල්රූ ජයසේකර**



# එදා මෙදා තුර අප පෙළූ වසංගත

## සංහිඳ පාමුල

පැරණි බෞද්ධ සාහිත්‍යයේ 'අභිවාතක' නම් රෝගයක් ගැන සඳහන් වෙයි. ඒ වූ කලී බියකරු වසංගතයෙකි. වසංගතය මුලින් ම වැලඳෙන්නේ මැස්සන්, මදුරුවන් වැනි කෘමි සතුන්ට ය. එයින් උහු මියෙති. ඊළඟට රෝගය වැලඳෙන්නේ ගවයන් වැනි සතුන්ට ය. ඉන් උහු ද මියෙති. අනතුරුව ගෘහයේ දැසි දැස්සන්ට වැලඳෙයි. ඔවුනගේ මරණය ද අනිවාර්ය වෙයි. අවසානයේ දී රෝගයෙන් ආසාදිත වන්නේ ගෘහයේ ප්‍රධානීන් ය. මරණයෙන් ගැලවෙන්නේ රෝගය පැතිරෙන විට ගෙයි බිත්ති බිඳගෙන පලා යන්නවුන් පමණි.

ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලියේ එන 'කුම්භඝෝෂක වස්තුවේ' ද මෙවන් පුවතක් අන්තර්ගතය. පසුව කුම්භඝෝෂක නම ලබන තරුණයාගේ සිටු මැදුර ද අභිවාතක රෝගයට ගොදුරු වෙයි. සිටාණන් හා සිටු දියණියන් රෝගයෙන් පීඩිත වූ පසුව ඔවුහු කඳුළු පිරි ඇසින් සිය පුතුගේ මුහුණ බලා ගෙයි බිත්ති බිඳගෙන පලා ගොස් ජීවත් වන්නැයි සිය පුතුගෙන් ඉල්ලා සිටිති. කාලයකට පසු ආපසු පැමිණ ජීවත් වීමට සතළිස් කෙළක් වස්තුව සඟවා ඇති තැන ලකුණු ද කියා දෙති. අභිවාතක රෝග යන්නෙන් විෂ සහිත වූ වාතය හේතුවෙන් හටගන්නා වසංගත රෝග යන අරුත ලැබෙයි. වසංගතය පිළිබඳ කෙරෙන විස්තරය ද හේතු සහිත වෙයි. මුලින් ම හටගන්නේ කෘමීන්ට ය. ඊළඟට වෙනත් සතුන්ට ය. මිනිස් කැල අතුරින් දාසයන්ට හා දැස්සන්ට මුලින් වැලඳීම ද තාර්කික ය. සතුන් හා ගැවසෙන්නේ, ශුද්ධ පවිත්‍ර කරන්නේ, වැඩපොළ කරන්නේ ඔවුහු ය. ඉසුරුමතුන්ට පෙර ඔවුනට වසංගත වැලඳීම හා ඉන් මියයාම සිදුවෙයි.

වසංගත ඈත අතීතයේ පටන් සමාජය කැලඹීය. දරු, තරුණ, වැඩිහිටි, මහලු භේදයකින් තොරව මිනිසුන් මරා දැමී ය. විටෙක පවුල් පිටින්, විටෙක ගම් පිටින් මරණය වෙත දැක්කී ය. ලංකාවට පමණක් නොව ලෝකයටම මෙම අත්දැකීම පොදු විය. විද්‍යාව දියුණු වූ පමණින්, තාක්ෂණය දියුණු වූ පමණින් වසංගත සම්පූර්ණයෙන් ම පිටු දැකීමේ හැකියාවක් ලැබී නැත්තේ ය.

1935 අවුරුද්ද විසිවන සියවසේ වසංගත ගැන කතා කරන විට අමතක කළ නොහැකි අවුරුද්දකි. සිරිලක පුරා මැලේරියා වසංගතය පැතිරී බොහෝ මිනිසුන් අකාලයේ මිය ගිය අවුරුද්දක් සේ 1935 අවුරුද්ද සැලකිය හැක. කෑගල්ල දිස්ත්‍රික්කයෙහි විශේෂයෙන් ම එහි තුන් කෝරල කොටසෙහි බොහෝ ජීවිත හානි සිදුවී ලු.

ක්වීනින් වතුර එකල මැලේරියාවට තිබුණු එක ම ප්‍රත්‍යක්ෂ ඖෂධය වූ බව මාගම් තෙන්නකෝන් සිය 'දිවි සයුරින් දිය දෝතක්' කෘතියේ සඳහන් කරයි. හිස් බඩ ක්වීනින් වතුර පතක් බීම ද, කොත්තමල්ලි හා බාර්ලි තැම්බූ වතුරින් බඩ පුරවා ගැනීම ද හැර ඊට වෙනත් පිළියමක් නොවූ බව ද ඔහුගේ කෘතියේ සඳහන් ය.

මැලේරියා සමයේ උණෙන් පීඩිත පෙදෙස්වල සංචාරය කළ එෆ්. සී. ජිම්සන් (මාගම් තෙන්නකෝන් ගිබ්සන් නමින් සඳහන් කරන මේ නම කෑගලු දිසාවේ පාලන ඉතිහාසය නම් කේ. පී. ආර්. ගුණතිලක ලිපියේ සඳහන් වන්නේ ජිම්සන් නමිනි.) කෑගලු දිසාවේ උප ඒජන්තවරයා ඉදිරිපත් කළ අනුවේදනීය සටහන් ද මාගම් තෙන්නකෝන්ගේ දිවිසයුරින් දිය දෝතක් කෘතියෙන් කියවන්නට ලැබෙයි.

ජිම්සන් සටහන් කරන ආකාරයට ඔහු ගිය එක් නිවෙසක ගැහැනියක් දරුවකු වදා හුන්නා ය. මවට හෝ දරුවාට සාත්තු සප්පායම් කරන්නට එහි කිසිවකු සිටියේ නැත. සියලු දෙන මැලේරියාවෙන් ආතුරව ගැහෙමින් සිටියහ. මව මෙන් ම දරුවා ද සිටියේ මරණය අබියස ය. ඊට අල්ලපු නිවසේ දරුවෙක් මිය ගොසිනි. පවුලේ සාමාජිකයෝ උණෙන් ගැහෙමින් විලාප තබති. මිනිය වළලා දමන්නට තරම් ශක්තියක් උන් එකෙකුටවත් නැත.

ජිම්සන් උප ඒජන්තවරයා ගිය තවත් ගෙදරක නිවැසි සය දෙනකුගෙන් පණ ඇතිව සිටියේ බිළිඳෙක් පමණි. සෙසු අය මියගොස් සිටියහ. වළ දමන්නට කෙනකු ඉදිරිපත් වන තොරතුරු මළමිනී තැන් තැන්වල තිබිණි. ජීවතුන් අතර සිටින බිළිඳා මියගිය මවගේ තනපුඩු උරමින් ජීවත්වීමේ නිෂ්පල උත්සාහයක් දැරී ය.

මැලේරියාවට ගෙදුරු වී උණෙන් වෙවුලමින් සිටි රෝගියකුට කැඳ රැගෙන ගිය නෑදෑ තැනැත්තකුට උණෙන් උමතුව සිටි රෝගියා පිහියෙන් ඇන්නේ ලු.

එදවස මැලේරියා වසංගතයේ විස්තර කියවන අපට සිහිපත් වන්නේ විශාලා මහනුවර ය. එහි වූ රෝ බියය. ඒ ගැන කියන බුදුගුණාලංකාර නම් කවියෙන් කියැවුණු බණ පොතය.

**ගොඩ ගොඩ ඇට සැකිලි**
**තැන තැන තුබූ බලි බිලි**
**මහ මග රෙදි වැරලි**
**එපුර හැම තැන බලත් පිළිකුලි**

1935 දී ලංකාවේ මිලියන හයක් පමණ ජනගහනයෙන් මිලියන එක හමාරක් පමණ මැලේරියාවට ගෙදුරු විය. අසූ දහසක් පමණ මැලේරියාවෙන් මිය ගියේ ලු.

බණ කතා සාහිත්‍යයේ සඳහන් 'අභිවාතක' රෝගය සේ ම, 20 වන සියවස දක්වා දස වද දුන් මැලේරියාව සේ ම කොවිඩ් 19 වසංගතය ද බෙහෙවින් බියකරු ය. විද්‍යාවේ හා සෞඛ්‍යයේ මහා පරිමාණ දියුණුව නොතකා එය ලොව පුරා මහා පරිමාණයෙන් පැතිර යමින් පවතී. ලෝකයේම ආර්ථික හා මානව දියුණුවට ඉමහත් සම්බාධක පනවමින් ලොව අසරණ කරමින් සිටියි.

ශ්‍රී ලංකාවේ ද කොරෝනා ලොක් ඩවුන් සමයකින් ඉක්බිතිව ලද සැනසුම් අවධිය හමාර කරමින් ඊයක වේගයෙන් පැතිර ගිය බ්‍රැන්ඩික්ස් පොකුර ලිපිය ලියන මොහොත වන විටත් පීසීආර් පරීක්ෂණ මගින් සනාථ රෝගීන් දහස ඉක්මවා හමාරය. එය සාමාජයේ දැඩි අවධානයට ලක් විය යුත්තකි. අත්‍යවශ්‍ය කටයුත්තකට හැර බැහැර නොයා නිවෙස් තුළට වී කල් ගත කළ යුතු, සෙනඟ ගැවසෙන තැන්වලින් බැහැරව සිටිය යුතු, සම්භාෂණ, රැස්වීම්, මහා පරිමාණ පින්කම් ආදියෙන් වැළකී සිටිය යුතු, සැක සහිත නම් වහාම බලධාරීන් කරා දැන්විය යුතු තත්ත්වයකි. නිරන්තර අත සේදීම් හා මුඛ ආවරණවල පිහිට පැතිය යුතු තත්තවයකි. එය ඔබේ, පවුලේ අයගේ හා රටේ ආරක්ෂාව පිණිස ඉටු කළ යුතු වගකීමකි.



**මහානාම දුනුමාල**



# අප කොතැන ද?

අනවශ්‍ය දේට වියදම් නොවෙන නිසා සල්ලි ටික ඉතුරු වෙනවා. මේ වසංගතය අපට අත්‍යවශ්‍ය යන වචනයේ තේරුම කියලා දුන්නා." මේ බටහිර රටවල වසන ඇතැම් මිනිසුන්ගේ නිරීක්ෂණයකි. සැප පහසුකම් ඇති ජීවිත ගත කරන, වසංගතය නිසා තමන්ගේ රැකියාවට බලපෑමක් නොවූ පිරිසකට එවැනි ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැකි මුත් ජීවිතය අමාරුවෙන් ගැටගහගත් දැන් රැකියා අවස්ථා නැති වී ගිය පිරිසට සිදු වී ඇත්තේ කබලෙන් ළිපට වැටුණා වැනි අභාග්‍යකි.

වසර 2020 දීත් ජීවත්වීම උදෙසා බිල් පත් ගෙවා ගැනීම පිණිස තමන්ව වසංගතයට නිරාවරණය වීම වලකා ගත නොහැකි වූ මිනිසුන් පිරිසක් සිටීම මානව ශිෂ්ටාචාරයේ අප දැන් සිටින තැන ගැන සිතන්නට අපව පෙළඹවිය යුතුයි. නමුත් අවාසනාවකට ආත්මාර්ථකාමී අප විසින් රෝස වසන්තයක් සේ සැළකෙන ධනේශ්වර ක්‍රමය තුළ අපේ අවධානයට ලක්වෙන්නේ කබලෙන් ළිපට වැටී පිච්චෙන මිනිසුන් ගැන නොවේ.

ශරීර සෞඛ්‍ය වසංගතයට නිරාවරණය කරමින් ජීවන අරගලයේ යෙදෙන පන්තියේ මිනිසුන් සහ බැංකු ශේෂය යන්තමින් වැඩි වී ඒ වියදම් කිරීමට නොඉවසිල්ලෙන් ඉන්නා පන්තියේ මිනිසුන්ගේත් වෙනසක්, ලෝකය පාලනය කරන, මේ සියල්ලටම ඉහළින් ඉන්නා කෝටිපතියන්ට ප්‍රකෝටිපතියන්ට නැත. ඒ දෙපිරිසම ධනවතුන්ට ලාභය උපදවමින් පවතින ක්‍රමය ඇදගෙන යන්නන් පමණකි. වැඩ කිරීමට ශ්‍රමිකයින් පිරිසක් සහ මිලදී ගැනීමට වියදම් කිරීමට පාරිභෝගිකයින් පිරිසක් වෙමින් සාමාන්‍ය මිනිසා ජීවන ගමනේ දවසින් දවස ගත කරයි.

මේ සියලු කාරණා අතරේ අපට සේවය කිරීමට, අප ආරක්ෂා කිරීමට පත් කර ගන්නා ආණ්ඩු කොහේද? ඔවුන්ගේ කාර්යභාරය කුමක් ද? ඒ ජනතා නියෝජිතයින්ගේ වැඩ කටයුතු දෙස පැහැදිලි දැක්මක් අපට ලබාදෙන්නේ ද? කොරෝනා වසංගත තත්වය ව්‍යසනයට පත් කරන්නේ ලෝකය පුරා සාමන්‍ය මිනිසුන්ගේ ශරීර සෞඛ්‍ය පමණක් ද?

නමුත්, ආවේගශීලි ලෙස පැතිරෙන මාරන්තික ප්‍රතිඵල ඇති කලහැකි වෛරසයක පැතිරීම හමුවේ අපට රට කරවන කාරණාවලට අවධානය යොමු කරන්නට වෙලාවක් අවස්ථාවක් කොහෙද?

අපට මුණගැසෙන්නට බැරිය. විරෝධතා දැක්වීමට නොහැකිය. කොටින්ම ඇතැම් රටවල මේ වේලාවේ අවංක අදහස් ප්‍රකාශනය නිසා අත් අඩංගුවට පවා පත්වීමට ඉඩක් ඇත. ඇතැම් රටක ඔබ නිකන්ම මෝඩයකු සේ හංවඩු ගැසෙන්නට ඉඩක් ඇත. ඇතැම් රටක ඔබ දේශද්‍රෝහියකු ලෙස සැළකෙන්නට ඉඩ ඇත. ඇතැම් රටක ඔබ කුමන්ත්‍රණකාරී කල්පනා ඇති කෙනකු සේ සරදමට ලක්වීමට ඉඩ ඇත.

ඉතින් මරණ තුනක් මැද වුව පැණි කෑමට හැකි සාමන්‍ය ක්‍රමය අප කරබාගෙන ඇදගෙන යමින්, දවසින් දවස ජීවිතය ගත කරන්නෙමු; පැමිණි දුකේ පැණි රස ගැන හර්ෂය ප්‍රදර්ශනය කරමින් අන්තරායක් නැත්තා සේ හැසිරෙමු.

අප මේ තරම් බය කුමකට ද?

මා කියන්නට අදහස් කරන්නේ ධනේශ්වර ක්‍රමය හෝ පවතින ආණ්ඩු බිඳ හෙළා දැකීමට විපලව කිරීමට නොවේ. මා කියන්නට උත්සහ කරන්නේ අප ජීවිතය පිළිබඳ ඉගෙන ගන්නා පාඩම් ප්‍රයෝජනයට නොගැනීම ගැනයි. අප සියල්ලෝ මානව ශිෂ්ටාචාරය තුළ දිගු ගමනක් ආ පිරිසක් හැටියට දියුණු යැයි සළකා අපව හඳුනා ගත්තත්, ඉතිහාසය පුරා වූ දේවලින් ඇතැම් ජන කොටස් පාඩම් ඉගෙන ගනිද්දී ඇතැම් ජන කොටස් වික්ෂිප්ත බලයක් නැති තැනක හිර වෙන්නේ ඇයි?

එය කරුමයට, දෙවියන්ගේ කැමැත්තට, ස්වභාවික තෝරා ගැනීමකට භාර දීමට ලෑස්ති වූ අය ඇති බව අපි දනිමු. නමුත් වසර 2020 දීත් ඒ තරම් මුග්ධතාවයකින් අන්ධවීමට ඔබට පුළුවන් ද?

වසංගතයේ භීතියෙන් හදිසි මිලදී ගැනීම්වලට ජනතාව යොමු වීම වැළකීමට වියට්නාමයේ රජය ඇතැම් දේ නොමිලේ ලබා දීමත්, ඒවා නිසියාකාරව බෙදෑ හැරීමකට ලක්වීමත් ගැන කටයුතු කළ අතර නිරෝධායනය වෙමින්, වෛරසයට නිරාවරණය නොවෙමින් සිටිය යුතු අයට වැටුප දිගටම ලැබීමට එම රජය කටයුතු කළහ.

වෙනිසුවේලා රජය විසින් රැකියා විරහිතයින්ගෙන් නිවාස කුළී එකතු කිරීම කොරෝනා වසංගත කාලයේදී මාස කිහිපයකට තහනමට ලක් කෙරිණි. වසංගතයේ මුවාවෙන් සේවකයින් රැකියාවෙන් පහකිරීම තහනම් කෙරුණි. කියුබාව ඔවුන්ගේ සෞඛ්‍ය සේවකයින් දොරින් දොර යවමින් සාමාන්‍ය මිනිසුන්ගේ ආරක්ෂාව සැළසීමට කටයුතු කළේය.

ඒ අතර මිනිසුන් ලක්ෂ ගණනක් කොරෝනා වසංගතයෙන් අහිමි කරගත් ඇමරිකාවේ ඇතැම් නායකයෝ ලෝක සෞඛ්‍ය සංවිධානයට ආධාර නොදෙන්නේ යැයි කියමින් එම එකමුතුවෙන් අස්වීමට කටයුතු කෙරුවෝය. විද්‍යාඥයින්, විශේෂඥයින්ගේ විද්‍යාත්මක උපදෙස් බැහැර කරමින් වෛරසය නොසළකන්නට රට වැසියන්ට උපදෙස් ලැබුණි. දැන් මේ මොහොතේ ලෝකයේ බලවත්ම රටක් වූ අමෙරිකාවේ ජනපතිතුමාටත් කොරෝනා වෛරසය ආසාදනය වී ඇත. ඔහු විශ්වාස කරන දෙවියකුගේ ආශිර්වාදයත්, වෛද්‍ය විද්‍යාවේ පිහිටත් ලැබී ඔහු සුව වේවා යැයි මම පතමි. නමුත් ඒ දෙසරණම නොමැතිව අතහැර දැමූ වැඩිහිටි නිවාසයක කොරෝනා ආසදිතව මිය ගිය වැඩිහිටියන් අමතක කරන්නට නොහැකිය. එය ඇමරිකාවේ ප්‍රශ්නයක් ලෙස නොසළකා හරින්නට ඔබට හැකි ද?

මේ වෙලාවේ ඇඟිල්ලක් ගසන්නට ඉඩක් නැති පොදු ප්‍රවාහන සේවයක අමාරුවෙන් එල්ලී රක්ෂාව කරන්නට අනාරක්ෂිතව ගමනේ යෙදෙන ඔබ තවමත් දියුණු නොවූ රටක ප්‍රශ්නයක් ලෙස නොසළකා හැරීමට මට හැකි ද? එසේ කළ හැකි නම් මේ කතාවේ පලක් නැත. නමුත් සත්‍ය වන්නේ එසේ කිරීමට නොහැකියාවයි. අපි විශ්ව ගම්මනයක වුවමනාව හඳුනාගත් දියුණු මිනිස්සු වන්නෙමු. අපේ ජීවත් වීම සිදු විය යුත්තේ අප වෙනුවෙන් මිස අපව පෙළන්නන් වෙනුවෙන් නොවේ. අප දේශපාලනිකව දැනුවත් වීම වැදගත් කාරණාවකි.

වසංගතයකදී පවා ඇස් ඇරගෙන කටයුතු කිරීම අපේ යුතුකමකි.



**හිමාලි එන්. ලියනගේ**



බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

**'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න**

'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk